# භාෂණ සිංහල ස්පර්ෂ ශබ්ද විස්තෘතිය කෙරෙහි ඉංග්‍රීසි වාංමාලාවේ බලපෑම

ඕ. ජී. ඊ. එන්. ටී. සමරවීර[1]

ස්පර්ෂ ශබ්ද යනු ශබ්ද උත්පාදනයේ දී උච්චාරණ ස්ථාන හා කරණ ගැටී වායු ධාරාව එක් වර නවත්වාලීමෙන් ඇති වන පූර්ණ අවරෝධය හේතුවෙන් උපදින්නා වූ ව්‍යඤ්ජන ශබ්ද විශේෂයකි. භාෂණ සිංහලයේ ස්පර්ෂ ශබ්ද දහයකි. එනම් [p], [b], [t], [d], [ʈ], [ɖ], [c], [ɟ], [k], [g] යනුවෙනි. ඉන් [c], [ɟ] ශබ්ද දෙක ඡායා ස්පර්ෂ ශබ්ද ලෙස උච්චාරණය වේ. ශබ්දයන් ගේ විස්තෘතිය පිරික්සීමේ දී පදාදි පරිසරය, පද මධ්‍යගත පරිසරය, ද්විත්ව පරිසරය, සංයුක්ත පරිසරය හා පදාන්ත පරිසරය සැලැකිල්ලට ගැනේ. මේ පරිසරවල භාෂණ සිංහල ස්පර්ෂ ශබ්ද යෙදෙන ආකාරය කෙරෙහි අවධානය යොමු කරන විට පෙනීයන්නේ ද්විඕෂ්ඨජ අඝෝෂ ස්පර්ෂ ශබ්දය [p], දන්තෝපචාරජ අඝෝෂ ස්පර්ෂ ශබ්දය [t], කාකුද්‍ය අඝෝෂ ස්පර්ෂ ශබ්දය [k] යන ස්පර්ෂ ශබ්ද තුන හැර අනෙකුත් ස්පර්ෂ ශබ්ද සියල්ල දේශීය පදවල පදාන්ත පරිසරයේ නො යෙදෙන බව යි. එහෙත් ඉංග්‍රීසියෙන් ගැනුණු ඍණිත පද හේතු කොටගෙන දන්තෝපචාරජ ඝෝෂ ස්පර්ෂ ශබ්දය [d] හැර අනෙකුත් ශබ්ද හය සිංහල භාෂණයේ පදාදි පරිසරයෙහි ද නියොජනය වීමක් දක්නට ලැබේ. නිදසුන් ලෙස b > læb, ʈ > bæʈ, ɖ > ka:ɖ, c > mæc, ɟ > bæɟ, g > bæ:g දැක්විය හැකි ය. මේ අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණ මේ විස්තෘතික ස්වරූපය විග්‍රහ කිරීම යි. මේ සඳහා ප්‍රාථමික මූලාශ්‍රයය ලෙස සමකාලීන සිංහල භාෂණයෙන් දත්ත රැස් කැරගනු ලැබිණ. ඉංග්‍රීසි බලපෑම හේතුවෙන් සිංහල භාෂා ශබ්ද සංස්ථිතියේ සිදු ව ඇති මේ වෙනස්කම් ශබ්ද විචාරාත්මක හා පදිම විචාරාත්මක දෘෂ්ටියෙන් විමසුමට ලක් කැරේ. ඒ අනුව ඉංග්‍රීසි ඍණිත පදවල බලපෑමෙන් සිංහල භාෂණයේ ස්පර්ෂ ශබ්ද විස්තෘතියට සිදු ව ඇති වෙනස හා ඒ හේතු කොටගෙන පදවල සිදු වන රූපීය විශේෂතා මේ අධ්‍යයනයෙන් ප්‍රකට වේ. පොදුවේ ගත් කල භාෂා සංස්පර්ෂය හේතුවෙන් භාෂාවක සංස්ථිතියට ඇති වන ඍජු හා වක්‍ර බලපෑම් පිළිබඳ අවබොධයක් මෙයින් ලැබේ.

**ප්‍රමුඛ පදඃ** ස්පර්ෂ ශබ්ද, විස්තෘතිය, පදාදි පරිසරය, ඉංග්‍රීසි ඍණිත පද, භාෂා සංස්පර්ෂය

[1] වාග්විද්‍යා අධ්‍යයනාංශය